**නිපුණතාවය :-** ව්‍යවසායකත්වය හා එහි වැදගත්කම අවබෝධ කොට ගෙන ව්‍යවසායකයකු වීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :-** ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය විමසයි.

(01) භාණ්ඩ හා සේවා යන්න පැහැදිලි කරන්න.

(02) භාණ්ඩ හා සේවාවලින් මිනිස් අවශ්‍යතා සහ වුවමනා ඉටුකිරීම සිදුවේ. භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් 04 ක් දක්වන්න.

(03) පහත දැක්වෙන ලක්ෂණවලින් භාණ්ඩයක ලක්ෂණයක් නොවන්නේ,

(i) ස්පෘශ්‍ය වේ. (ii) සපයන්නාගෙන් වෙන්කළ හැකි ය.
(iii) ගබඩා කළ හැකි ය. (iv) පාරිභෝගිකයා නිෂ්පාදන ක්‍රියාවලියට අත්‍යවශ්‍ය වේ.

(04) පහත දෑ අතුරෙන් සේවාවකට උදාහරණයක් නොවන්නේ,

(i) උපකාරක පංති (ii) බැංකු කටයුතු (iii) නිමි ඇඳුම් අලෙවිය (iv) කොණ්ඩා කැපීම

(05) ව්‍යාපාරයක පවත්නා ගති ලක්ෂණ 04 ක් දක්වන්න.

(06) දී ඇති නිවැරදි වචන යොදා හිස්තැන් පුරවන්න.

i. ව්‍යාපාර කටයුතුවලින් ලාභ මෙන්ම අලාභ ද සිදුවීම -------------------ලෙස හැඳින්වේ.
ii. ව්‍යාපාර අවදානමට ප්‍රධාන හේතුව --------------------------- යි.
iii. ව්‍යාපාර කටයුතු වලදී වැඩි සැලකිල්ලක් දක්වන්නේ -------------- ගනුදෙනු කෙරෙහි ය.
iv. ව්‍යාපාර කටයුතු සඳහා සීමිත සම්පත් භාවිතා කිරීම නිසා එය ----------------- ලෙස ද හැඳින්විය හැකි ය.
v. සපයන පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස්නොවී සමජාතීය බව රැකිය හැක්කේ ------------ වල පමණි.

( ආර්ථික කටයුත්තක් , අවදානම , භාණ්ඩ , සේවා , අවිනිශ්චිතතාව , මූල්‍ය ගනුදෙනු , මූල්‍ය නොවන ගනුදෙනු )

**( පෙළ පොතේ පිටු අංක 25 සිට 28 දක්වා හොඳින් කියවා පහත ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න)**